6 වන පිටෙන්

නොදිටුවෙමි. මන්ද යත් මාගේ ළමාවියේ දිය උල්පත් ඔවුන් තුළින් මා දුටු නිසාවෙනි. අපි දෙවැට දිගේ කුඹුරට දුවගොස් කොයිතරම් නම් සෙල්ලම් කළාද, අපි සෑදු කටුමැටි ගෙවල්, වැළිබත්, සහෝදර සහෝදරියන් සමග ගෙවූ ළමාවිය. මා ඉන් මිදුනේ හැරිගේ කටහඩ අවධිවීමෙනි. දැන් ඇති සෙල්ලම් කළා හෙට ඉස්කෝලෙ යන්න ඕන නේද ? තාත්තාගේ කටහඩ ඇසෙත්ම දරුවන් මා දෙස බැලූ ලීලාව. හරි හරි තව ටිකක් ඉඳලා ඉක්මනට ගෙටයමු. මා ළමාවිය වැටකොටු සීමා මායිම් තුළ සිරවෙනු දැකිමට අකමැති වූයෙමි. ඔවුනට සීතල ගැන දැනිමක්වත් නැතුවා සේය.

මා සෑදු කේක් සමඟ තේ එකක් හැරීට දුන්නේ ගතවෙලා ගත් සීතලෙන් උණුසුම් වීමටයි. ඔහු අත්වැස්මෙන් දෑත මුදාගෙන කේක් රසබලනු දුටු දියණියන්ද දුව විත් කේක් රස බලන්නට වූහ. සීතලට බඩගිනි නේද ? ඔයාලා ගේ සෙල්ලම් ගේ හරි ලස්සනයි. මට පිළිතුරු දුන්නේ චුටි දුවයි. ඒක දියවෙන්න ඉස්සෙල්ලා අපි තව එකක් හදමුනේද අක්කා. අක්කා ද හිසවනා එය අනුමත කලාය.

මම්මා නැගිටින්න දැන් කෑම වේලාව ලොකුදුව කියද්දී, මට වටපිට බැලුනේය. කණගාටුයි, මෑම් මේ ඔයාගේ කෑම ට්‍රේ එක. ගුවන් සේවිකාව මා නින්දේ යයි සිතන්නට ඇය චූටිදුව සැපසේ නිදිය. මෙතෙක් අතීත ආවර්ජනයක හිටිබැවිනුත් පිපාසයක් දැනෙන්නට විය. අනෙක් පසින් බීම වගී රැගත් ට්‍රොලියක් මා ගුවන් සේවිකාවගෙන් වතුර වීදුරුවක් ඉල්ලන්ටත් පෙර ඇය මට දිගු කලේ සුදු වයින් වීදුරුවකි. ගමනාන්තයේ සතුට ප්‍රකාශ කිරීමට ඇය මට දී ඇත්තේ ෂැම්පේන් වීදුරුවකි. යන්තම් උගුර තෙමාගෙන හරී ගැසී මොහොතක් කල්පනා කෙළෙමි. පුන්චි ජනෙල් කවුළුවෙන් ගොඩබිමක් පෙනේ. අහස දෙසබලද්දී සුදුම සුදුම වළාකුලින් පිරීගොස්ය. අර සීත හිම කඩා වැටුනේ මේ වළාකුළු මැදින් කිසිම වෙනසක් නැති සුදුපැහැය ඒ නිසාය මා අත වීදුරු වදුටු ගුවන් සේවිකාව සතුටු වෙන්න මැම් කියමින් ඉදිරියට ඇදී ගියේ හිස් ට්‍රේ එකද රැගෙනය.

මද වේලාවකට පසු, ගුවන් නියමුවාගේ හඬ ගුවන සිසාරා විසිර ගියේය. රෝමයේ ශ්‍රීයුමොචීනෝ ගුවන් තලයට ළඟාවෙමින් සිටින බවත්, සීට්බෙල්ට් තද කරගැනීමට අන ලැබිණි. පුංචි ගැස්සීමකින් පසු ගුවන්තොටුපොළ පෙනෙද්දී සියල්ලන් අත්පොළසන් දුන්නේ ගමනක අවසානය සතුටු ලෙසින් ගෙවු බැවිනි.

Cartoon By Shanika Somatilake







